# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,415- 2024 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස : අධිකරණ

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | 502 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 දෙසැම්බර් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

501 - B 82635 —177 (2024/12)
C1-

# පිස්කල් විකිණීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පී. එල්. සී.,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

*..........පැමිණිලිකරු.*

නඩු අංකය : DMB/350/19
ඇස්කිසි අංකය : 112/2024
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 2,072,139.69

*එදිරිව*

බටුවත්ත ගමගේ නිමල් දසනායක,
අංක 39/3, පහළ කරගහමුණ,
කඩවත.

*.............විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2023ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින ඇතුලත් කරන ලද ඒකපාර්ශ්වික තීන්දු ප්‍රකාශය අනුව, විත්තිකරුට විරුද්ධව තීන්දු ප්‍රකාශ කර ඇති අතර,

(අ) ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් විසි ලක්ෂ හැත්තෑ දෙදහස් එකසිය තිස් නවයයි ශත හැට නවයක (රු. 2,072,139.69) මුදල හා ඒ මත පොළිය ගෙවීම පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබා දෙන ලෙසටත්,

(ආ) විත්තිකරු ඉහත රුපියල් විසි ලක්ෂ හැත්තෑ දෙදහස් එකසිය තිස් නවයයි ශත හැට නවයක (රු. 2,072,139.69) යන මුදල හා නෛතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඩී. එෆ්. ඒ. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 3859 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබාදෙන ලෙසටත්,

(ඇ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත්, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2024 ජූලි මස වන මස 17 වැනි දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින 10.30** ට ඉහත නම් සඳහන් විත්තිකරුගේ නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, ගම්පහ ලියාපදිංචි කොට්ඨාසයේ මහර ප්‍රාදේශීය සභා සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළ කරගහමුණ බටහිර - 249 බී ග්‍රාම නිලධාරි වසම තුළ මහර පහළ කරගහමුණ පිහිටි "මිල්ලගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 58/1992 සහ 1992.01.30 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 සඳහා මායිම් : උතුරට : ඩබ්ලිව්. ඒ. සයිමන්ගේ ඉඩම ද, නැගෙනහිරට : පාර (අඩි 8 - අඩි 4) ද, දකුණට : ලොට් 02 ද, බටහිරට : වනිගසේකරගේ ඉඩම ද යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටක (පර්. 08) අංක 58/1992 දරන පිඹුර ප්‍රකාරව ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. (මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M/540/04 හි ලියාපදිංචි කර ඇත.

*ඉහත කී ඉඩම නැවත මැනීමකට අනුව පහත දැක්වේ.*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, ගම්පහ ලියාපදිංචි කොට්ඨාසයේ මහර ප්‍රාදේශීය සභා සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළ කරගහමුණ බටහිර - 249 බී ග්‍රාම නිළධාරි වසම තුළ මහර පහළ කරගහමුණ පිහිටි කඩවත පාර අංක 276/5 දරන "මිල්ලගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 7194 සහ 2004.09.11 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 සඳහා මායිම් : උතුරට : ඩබ්ලිව්. ඒ. සයිමන්ගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : අඩි පාර (අඩි 4) ද, දකුණට : එල්. එම්. ඇනා මරියාට අයිති ඉඩම ද, බටහිරට : එල්. එම්. ඇනා මරියාට අයිති ඉඩම ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටක (පර්. 08) අංක 7194 දරන පිඹුර ප්‍රකාරව ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

වර්ෂ 2024 නොවැම්බර් මස 29 වැනි දින දී ය.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතුය.
(02) ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.
(03) රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

ඩී. කේ. එන්. වික්‍රමආරච්චි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මහර.

12 - 119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.